# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
**மஹபொல உயர்கல்வி புலமைப் பரிசில் நம்பிக்கை நிதியம்**
**MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND**

4 වන මහල, ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, 191, ධර්මපාල මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා.
4வது மாடி ,ஜே.ஆர்.ஜயவர்தன நிலையம்,191,தர்மபால மாவத்தை,கொழும்பு 07.
4TH Floor, J.R. Jayewardene Centre, 191, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka


මගේ අංකය / எனது இல / My No. MTF/1/1/1(2019/2020)   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2022.02.28

1. **උපකුලපති,**
   **කොළඹ, පේරාදෙණිය, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, මොරටුව, යාපනය, රුහුණ, නැගෙනහිර, අග්නිදිග, සබරගමුව, රජරට, වයඹ, ඌව වෙල්ලස්ස, සෞන්දර්ය කලා, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, වවුනියා විශ්වවිද්‍යාලය**

2. **අධ්‍යක්ෂ,**
   **දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක පාසල, ස්වාමි විපුලානන්ද ආයතනය**

3. **මණ්ඩපාධිපති,**
   **ශ්‍රී පාලි මණ්ඩපය, නැගෙනහිර විශ්ව විද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය),**

මහත්මයාණනි/මහත්මියණි,

**<u>මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2019/2020</u>**

2019/2020 ප්‍රවේශිත වර්ෂයේ ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාල මහපොළ ශිෂ්‍යත්වලාභී සිසුන්ගේ නාම ලේඛණය, විද්‍යුත් තැපැල් මඟින්, ඔබ විශ්ව විද්‍යාලය වෙත ගෙවීම් ලේඛණ එවීමට ලබාගත් E-mail ලිපිනයන් වෙත යොමු කරනු ලැබේ.

02. මෙම මහපොළ ශිෂ්‍යත්වලාභී නාම ලේඛණය ඔබ විශ්ව විද්‍යාලයේ නාම පුවරුවේ ප්‍රදර්ශනය කරන මෙන් කාරුණිකව ඉල්ලමි. එහිදී මහපොළ ශිෂ්‍යත්ව හිමි සිසුන්ට මහපොළ ශිෂ්‍යත්ව ලියාපදිංචි ආකෘති පත්‍රය www.mahapola.lk මහපොළ වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකි බව ඔවුන් වෙත දැන්වීමට කටයුතු කරන්න.

03. ශිෂ්‍යත්වලාභියා විසින් ඉහත 02 හි පරිදි එම වෙබ් අඩවියට පිවිස සිය ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කර මහපොළ ශිෂ්‍යත්ව ආකෘතිය භාගත කොට සම්පූර්ණ කරන ලද ලියාපදිංචි අයදුම්පත පෞද්ගලික බැංකු ගිණුමට අදාල පාස් පොතේ ඡායා පිටපතක් ද සමඟ සෘජුවම ( Online ) මහපොළ අරමුදල වෙත යොමුකල යුතුය.

04. ඉහත Online මඟින් යොමුකරන ලද මහපොළ ශිෂ්‍යත්ව ආකෘති පත්‍රයේ පිටපතක් ශිෂ්‍යත්වලාභියාගේ අත්සන සහිතව විශ්ව විද්‍යාලය වෙත ලබාදිය යුතු බව සිසුන් දැනුවත් කොට එය ශිෂ්‍යත්වලාභියාගේ Online මඟින් යොමු කරන ලද පෞද්ගලික බැංකු ගිණුමට අදාල බැංකු පාස් පොතේ පැහැදිලි ඡායා පිටපතක් සත්‍ය පිටපතක් බවට සහතික කොට විශ්ව විද්‍යාල ලේඛකාධිවරයාගේ නිර්දේශ සහිතව සති දෙකක් ඇතුලත මහපොළ අරමුදල වෙත එවීමට ක්‍රියා කරන මෙන් වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

05. මෙම 2019/2020 ප්‍රවේශිත වර්ෂ ශිෂ්‍යත්වලාභීන්ගේ ගෙවීම් 2022 මාර්තු මාසයේ සිට ආරම්භ කිරීම සඳහා ඔවුන්ගේ අධ්‍යයන වර්ෂය ආරම්භ කරන ලද දිනය ( එක් එක් පාඨමාලාවට අදාල වන සේ ),

2022.02.28 දක්වා වන අධ්‍යයන නිවාඩු මාසද සමහ ගෙවිය යුතු භිහ වාරික කුමන මාසවලට අදාලව ද යන්න සඳහන් කර පෙර වර්ෂයේ දී මෙන් අදාල E-mail ලිපිනයන් වෙත එවීමට කටයුතු කරන මෙන් ඉල්ලමි.

මෙයට - විශ්වාසී,

එම්.පරාක්‍රම බණ්ඩාර,

අධ්‍යක්‍ෂ,

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

පිටපත් :

1. ලේකම්,වෙළෙඳ අමාත්‍යාංශය .- දැ.ගැ.ස.
2. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව. - දැ.ගැ.ස.
3. ලේකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව. - දැ.ගැ.ස.
4. ගණකාධිකාරී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව. - දැ.ගැ.ස.
5. පීඨාධිපති , සියලුම පීඨ - දැ.ගැ.ස.
6. ලේඛකාධිකාරී. - අවශ්‍ය කටයුතු සඳහා
7. ලේඛකාධිකාරි(ශිෂ්‍ය සේවා)/නියෝජ්‍ය ලේඛකාධිකාරී - අවශ්‍ය කටයුතු සඳහා